# ඩොලර් අර්බුදය සහ ආපදා අධිරාජ්‍යවාදී මෙහෙයුම:

# කළ යුත්තේ කුමක්ද?



## නෑසූ කන් තිබූ, නොදකින ඇස් තිබූ, ජනපති ගෝඨාභය පලායාමට පෙර නොකියැවූ කතාව...

මේ දිනවල ආණ්ඩුව ඩොලර් මිලියන 500ක විදේශ ණයක් ගෙවා දැමීමට හැකි වූ බවට සහ ඒ නිසා ඩොලර් අර්බුදය ජය ගැනීම තමාට කජ්ජක් නොවන බවට උදම් අනන ආකාරය දැකගත හැක. එහෙත් එම ණයවලින් අඩක් ගෙවා දැමීම සඳහා රටේ රන් සංචිතවලින් අඩක් විකුණා දැමූ බව සැඟවිය නොහැක. එසේ සංචිත ලෙස ඉතිරිව තිබූ රන් මෙ.ටො. 6කින් මෙ.ටො. 3ක් විකුණා දමා ඩොලර් මිලියන 250කට ආසන්න ප්‍රමාණයක් සොයාගත් බව දැන් රහසක් නොවේ. එහෙත් ඊට පෙර 2020 මාර්තු මාසයේදී මෙවැනි බරපතල අර්බුදයක් නොතිබූ දිනවල මෙ.ටො. 12ක් ලෙස පැවති රන් සංචිතවලින් මෙ.ටො. 6ක් විකුණා දැමුවේ කුමක් නිසාදැයි පැහැදිලි නැත. ඊට අමතරව මේ වන විට විදේශ රැකියා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 60%කින් අඩු වී ඇති බව ද වාර්තා වේ. ඒ අනුව දළ වශයෙන් මාසයකට ඩොලර් මිලියන 600කට ආසන්න ප්‍රේෂණ ප්‍රමාණය දැන් 300කට අඩු ප්‍රමාණයකට පහත බැස ඇති බව පැහැදිලිය. අනෙකුත් සියලු ගැටළු මැද විදේශ රැකියා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ආරක්ෂාකර ගැනීමට ආණ්ඩුව සමත් වුවහොත් මාසිකව ඉන්ධන අවශ්‍යතාව, අත්‍යවශ්‍ය ආහාර, ඖෂධ  හා කර්මාන්තවලට අවශ්‍ය අමුද්‍රව්‍යවලින් යම් ප්‍රමාණයක් ආනයනය කිරීමට හැකියාව ලැබේ. එහෙත් ඒ පිළිබඳව උනන්දුවක් නොදැක්වීම පුදුම සහගතය.

උදාහරණයක් ලෙස රාජ්‍ය බැංකු මගින් ඩොලරයකට අමතර රු. 10ක් ගෙවීම මගින් බැංකු පද්ධතිය හරහා විදේශ මුදල් ගනුදෙනු දිරිමත් කළ නොහැක. ඊට හේතුව "කළු වෙළඳපළ" තුළින් එම ප්‍රමාණය මෙන් තුන්ගුණයක් අමතරව ලබාගත හැකිවීමය. ඒ අනුව ඒ සඳහා ඊට වඩා ආකර්ෂණීය දිරිගැන්වීම් 'පැකේජයක් අවශ්‍ය බව ඉතා පැහැදිලිය. ඒ ආකාරයට කළු වෙළඳපොළ දිරිමත් වන්නේ 2017දී එවකට අගමැති රනිල් වික්‍රමසිංහ මහතා විසින් සම්මත කරනු ලැබූ නව විදේශ විනිමය පනත නිසාය. එම පනතේ මූලික අරමුණ වූයේ විනිමය ජාවාරම් දිරිමත් කිරීම සහ රවී කරුණානායක මහතාට එරෙහිව අධිකරණය හමුවේ විභාග වෙමින් තිබූ විනිමය වංචාවකට අදාළ අපරාධ නඩුවකින් ඒ මහතා නිදහස් කර ගැනීම බවට සැකයක් නැත. එම පනත නැවත සංශෝධනය කිරීම යනු විනිමය අර්බුදය විසඳීම සඳහා වන අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියක් බව දැන් ඉතා පැහැදිලිය. ඊට අමතරව විදේශ මුදල් හුවමාරු සහ ක්‍රෙඩිට් ලයින් හෙවත් අදාළ රටෙන් භාණ්ඩ සහ සේවා මිලදී ගැනීම සඳහා ණය ගැනීම මගින් හුස්ම ගැනීම සඳහා යම් අවකාශයක් ලැබුණද ඒ මගින් මෙම වසරේ ගෙවීමට බැඳී සිටින ඩොලර් මිලියන 6800ක ණය සහ බැඳුම්කර වගකීම්වලින් නිදහස් විය නොහැකි බව ඉතා පැහැදිලිය. කෙසේ වෙතත් මේ වන විට ඉන්දියාව විසින් ලබාදීමට නියමිත ඩොලර් මිලියන 1500ක ණය පහසුකම මගින් ඉන්ධන අර්බුදයට මෙන්ම ආහාර සහ ඖෂධ අර්බුදයට කෙටිකාලීනව යම් විසඳුමක් ලැබේ. එහෙත් එම ණය සමඟ ගැටගැසී ඇති සැඟවුණු කොන්දේසි නිසා ආර්ථික අර්බුදය පමණක් නොව එය තවදුරටත් උත්සන්න කෙරෙන සමාජ දේශපාලන අර්බුද පවා නිර්මාණය වීමේ හැකියාව ඇත.

උදාහරණයක් ලෙස ඉන්දියාව විසින් ලබා දීමට නියමිත ඩොලර් මිලියන 1500ක ණය පහසුකම ලබාගැනීම සඳහා ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය ශ්‍රී ලංකාවට අවාසිදායක නව කොන්දේසි යටතේ වසර 99කට බදු දීමට සිදුවන බවට සාක්ෂි දක්නට ලැබේ. ඒ ආකාරයට පැලැස්තර විසඳුම් මගින් ප්‍රශ්නයට මුහුණ දීමට උත්සාහ කිරීමේ ක්‍රියාවලිය තුළ වැරදි කිහිපයක්ම සිදු වේ. පළමුවැන්න ඒ ආකාරයට පවතින ආර්ථික අර්බුදය විසඳිය හැකි බවට ව්‍යාජ මතයක් සමාජගත කිරීම මගින් සමාජය තුළ ව්‍යාජ සුබවාදී මතයක් නිර්මාණය කිරීමය. එවිට අර්බුදය උත්සන්න වන අවස්ථාවේ දී සමාජය මානසිකව ඊට සූදානම් නොමැති බැවින් බරපතළ මහජන අසහනයක් සහ විරෝධතාවක් ඇතිවේ. දෙවන වරද වන්නේ මෙම අර්බුදය කොවිඩ් වසංගතය සහ ඒ ආශ්‍රිතව පැනනැඟුණු ගෝලීය ආර්ථික අර්බුදය විසින් නිර්මාණය කරන ලද්දක් බවට ප්‍රශ්නය ලඝු කිරීමය. තුන්වන වරද ලෙස සැලකිය හැක්කේ පවතින අර්බුදය වර්තමාන ආණ්ඩුව බලයට පත්වීමෙන් පසුව ගනු ලැබූ වැරදි තීන්දු හෝ ආණ්ඩුවේ අසමත්කම නිසා පමණක් පැනනැඟුණු තත්ත්වයක් බවට විග්‍රහ කිරීමය. නමුත් ඉහත සඳහන් කළ දෙවන සහ තුන්වන කරුණු වත්මන් අර්බුදය ජනනය කිරීම සඳහා මුල් වූ සාධක ලෙස සැලකිය නොහැකි වුවත් ඒවා  තත්ත්වය වර්ධනය කිරීමට හේතු වූ බවට විවාදයක් නැත. කෙසේ වෙතත් ඒ මගින් වත්මන් අර්බුදයේ මූල හේතුව වන්නේ පවතින පරාධීන ආර්ථික මොඩලය තුළ දේශීය නිෂ්පාදන පද්ධතිය කඩාවැටීම බව තේරුම් ගැනීමට නොහැකි වේ.

එහිදී දක්නට ලැබෙන හතරවන වරද ලෙස සැලකිය හැක්කේ මෙම අර්බුදය නිසා රට බංකොලොත් වී මහා අර්බුදයක් නිර්මාණය වන බවට භීතියක් ඇති කිරීමය. එමගින් එක් පැත්තකින් විපක්ෂයට පටු දේශපාලන වාසි ලබාගත හැකි අතර

ආණ්ඩුව තුළ දේශපාලන අර්බුද උග්‍ර වීමට ද හේතු විය හැක. නමුත් වඩා භයානක වන්නේ ආණ්ඩුවට උපදෙස් දෙන යම් ආර්ථික ඝාතක විද්වතුන් හෝ නිලධාරීන් විසින් එවැනි මතයක් නිර්මාණය කිරීමය. විශේෂයෙන්ම යම් පිරිස් ප්‍රසිද්ධියේ අදහස් ප්‍රකාශ නොකළ ද රහසිගතව අදහස් දැක්වීමේදී "බිංදුවට වැටෙන එක හොඳයි. එතකොට සියල්ල අලුතින් පටන් ගැනීමට හැකි වෙයි" යනුවෙන් මත පළ කිරීමට හේතුව කුමක්දැයි කල්පනා කිරීම වැදගත් වේ. ඔවුන් විසින් එසේ සඳහන් කරන "බිංදුවට වැටීමෙන් පසුව නැවත නැගිටීම" පිළිබඳ සුබවාදී ලෙස කථා කිරීම ද විශේෂිත තත්වයකි.එම ඊනියා සුබවාදීන්ට අනුව කොළඹ සහ ත්‍රිකුණාමල නගරවල ආර්ථික මර්මස්ථාන ලෙස සැලකෙන ඉඩම් සහ රාජ්‍ය ආයතන විදේශීය සමාගම්වලට විකිණීම මගින් ඩොලර් මිලියන 6000ක් ඉපැයීමේ හැකියාව ඇත. ඊට අමතරව එල්.එන්.ජී. ගනුදෙනුව, කොළඹ වරායේ බටහිර ජැටිය සහ තිකුණාමලය තෙල් ටැංකි ගනුදෙනු මගින් තවත් ඩොලර් මිලියන 750ක් සොයාගත හැකි බව කියැවේ. එම්.සී.සී. ගිවිසුම අත්සන් කිරීම මගින් තවත් ඩොලර් මිලියන 485ක් ලබාගත හැකි බවට ද තර්ක කළ හැක.

ඒ අතර ත්‍රිකුණාමල වරාය ආශ්‍රිතව තෙල් පිරිපහදුවක් ඉදිකිරීම සඳහා ඩොලර් මිලියන 3000ක සෘජු විදේශ ආයෝජන ලබා ගැනීමේ හැකියාව ඇති බව ද කියැවේ. ඒ සියල්ලටම වඩා මේ වන විට ආණ්ඩුව විසින් සත්‍ය වශයෙන්ම හෝ ව්‍යාජ ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ලබා ගැනීම ප්‍රතික්ෂේප කරන තත්ත්වයක් තුළ විපක්ෂය විසින් එසේ කරන ලෙස ඉල්ලා සිටීම ද විශේෂත්වයකි. ඒ තුළ ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීමේ වැඩසටහනක් සමඟ ගැටගසා ලබාදෙන ණය පිළිගැනීම මගින් ඇතිවිය හැකි ද්විතීක අර්බුදය පිළිබඳ සංවාදය යටපත් වේ. කෙසේ වෙතත් ඒ ආකාරයට සමාජය භීතියට පත් කිරීම මගින් බාහිර පාර්ශ්වයන් විසින් ලබාදෙන විසඳුමක් පිළිගැනීම සඳහා තත්වය නිර්මාණය කිරීම "ආපදා අධිරාජ්‍යවාදය" ලෙස තාක්ෂණිකව හැඳින්වේ. බරපතළ ආර්ථික ආපදාවක්, ස්වාභාවික ආපදාවක් හෝ ත්‍රස්ත ප්‍රහාරයක් මගින් සමාජයට "ෂොක් ප්‍රතිකාරයක් (Shock Treatment) ලබාදීමෙන් පසුව එම සමාජය අසරණ කිරීම මගින් ඊට පෙර පිළිගැනීමට සූදානම් නොවන විසඳුමක් පිළිගැනීමට සැලැස්වීම ආපදා අධිරාජ්‍යවාදය ලෙස විග්‍රහ කෙරේ. ඊට අදාළ න්‍යාය හැඳින්වෙන්නේ ‘‘කම්පන ප්‍රතිකාර න්‍යාය හෙවත් ෂොක් ඩොක්ට්‍රින් (Shock Treatment) ලෙසය. ඒ පිළිබඳව නයෝමි ක්ලේන් නම් වූ ඇමරිකානු පර්යේෂණ මාධ්‍යවේදිනියක් විසින් ඉතා සාරගර්භ නිබන්ධනයක් ප්‍රකාශයට පත් කර ඇත.

එම න්‍යායට අනුව මෙම ආපදා තත්ත්වය උපයෝගී කරගනිමින් යම් බාහිර බලවේගවලට විකල්ප ක්‍රියාමාර්ග දෙකකින් එකකට අවතීර්ණය වීමේ හැකියාව ලැබෙනු ඇත. පළමුවැන්න අර්බුදය තවදුරටත් උත්සන්න කෙරෙන ආකාරයට තත්වයන් නිර්මාණය කර සමාජයේ පහළ ස්තර බරපතළ සමාජ ආර්ථික අර්බුදයකට තල්ලු කිරීම හරහා මහජන විරෝධතා රැල්ලක් ඇති කිරීම මගින් පවතින ආණ්ඩුව වෙනස් කිරීමය. එනම් ‘‘අරාබි වසන්තය" ලෙස හැඳින්වූ ආණ්ඩු පෙරළීමේ හෙවත් රෙජීම් චේන්ජ් මෙහෙයුමක් දියත් කිරීමය. ඒ සඳහා සකර්බර්ග්ගේ මානසික වහලුන් හෙවත් මුහුණු පොත් බලකාය මගින් උත්තේජන ලබා දීමේ හැකියාව ද ඇත. බොහෝවිට එම උපායමාර්ගය තෝරනු ලබන්නේ පවතින ආණ්ඩුවට විකල්පයක් ලෙස ජනතාවට පිළිගත හැකි පුද්ගලයෙකු හෝ බලවේගයක් මතුකර ගත හැකි තත්ත්වයක් තුළ ය. එසේ නොවන තත්ත්වයක් තුළ පවතින ආණ්ඩුවේ අත අඹරා අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීමේ හැකියාව හෝ විභවය තිබේනම් එම විකල්පය තේරීමේ ඉඩකඩ වැඩිවේ. විශේෂයෙන්ම මධ්‍යම පාන්තික කොටස් යොදාගනිමින් අර්බුදයෙන් බේරීම සඳහා වෙනත් කළ හැකි දෙයක් නොමැති බැවින් එවැනි බරපතළ ප්‍රතිසංස්කරණ අවශ්‍ය බවට සමාජ මතයක් ගොඩගැනීමේ හැකියාව ඇත්නම් සහ පවතින ආණ්ඩුව ඊට සූදානම් නම් එම විකල්පය තේරීමට වැඩි ඉඩක් ඇත. ඒ තුළ ඉන්දු පැසිෆික් භූ දේශපාලන න්‍යාය පත්‍රයට අදාළ කොන්දේසි ඉටුකර ගැනීමේ උවමනාව ද ඉදිරියට පැමිණිය හැක. උදාහරණයක් ලෙස MCC, SOFA සහ ETCA ආදී ගිවිසුම් මෙන්ම ජාත්‍යන්තර බෙදුම්වාදී ඉල්ලීම් ද කරළියට පැමිණිය හැක.

පවතින තත්වය තුළ අර්බුදය විසඳීම සඳහා ආණ්ඩුව තුළින් පමණක් නොව විපක්ෂය තුළින් පවා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යා යුතු බවට බලපෑම් එල්ල වීම තුළින් පැහැදිලි වන්නේ එම දෙවන විකල්පය තේරීමට වැඩි ඉඩක් තිබෙන බවය. ඊට අමතරව ආණ්ඩුවේ යම් පාර්ශ්ව, විශේෂයෙන්ම භාණ්ඩාගාර නිලධාරීන් විසින් තෝරනු ලබන යම් ක්‍රියාමාර්ග විසින් පෙන්නුම් කරනු ලබන්නේ ඉහත සඳහන් කළ බිංදුවට වැට්ටවීමේ ක්‍රියාවලිය දැනුම්වත්ව උත්සන්න කෙරෙන බවය. උදාහරණයක් ලෙස විදේශගත රැකියා නියුක්තිකයන් විසින් තම අනේවාසික විදේශ විනිමය ගිණුම්වලට ප්‍රේෂණය කරනු ලබන මුදල් සහ අපනයන ආදායම් වර්තමාන විනිමය අනුපාතය අනුව වහාම රුපියල්වලට පරිවර්තනය කළ යුතු බවට අනිවාර්ය නියමයක් පැනවිය යුතු බවට තීන්දු කිරීම මගින් සිදු වන්නේ කුමක්ද? ඒ පිළිබඳව මහ බැංකුව විසින් ප්‍රසිද්ධ නිවේදනයක් නිකුත් කර නැතත් ඊට අදාළව වාණිජ බැංකු විසින් තීරණයක් ගෙන ඇති බවට රාවයක් පැතිර ඇත. එම තීන්දුව ගනු ලැබුවහොත් සිදු වන්නේ කුමක්දැයි තේරුම් ගැනීමට මහ බැංකුව අධිපතිවරයාට තරම් මොළයක් අවශ්‍ය නැත. කෙසේ වෙතත් අවසානයේදී අත්‍යවශ්‍ය ද්‍රව්‍ය, විශේෂයෙන්ම ඛනිජ තෙල් ආරක්ෂණ තොග නොමැති තත්වයක් යටතේ හදිසි මිලදී ගැනීම් සඳහා අවශ්‍ය විදේශ විනිමය නොමැතිවීම තුළ විශාල මහජන අසහනයකට මගපෑදිය හැක.

මෙවැනි තත්වයක් තුළ පළමුව කෙටිකාලීන අර්බුදයට මුහුණ දීමේ හැකියාව වර්ධනය කර ගැනීම සහ ඒ සමගම දීර්ඝකාලීන අර්බුදය පියමන් කරන ආකාරය පිළිබඳව මහජන සංවාදයක් ඇති කිරීම ඉතා වැදගත් බව කිව යුතු නොවේ. විශේෂයෙන් ඉහත සඳහන් කළ ආකාරයට ආපදා අධිරාජ්‍යවාදයට ගොදුරු නොවීම සඳහා ආණ්ඩුව සහ මහජනයා පෙළඹවිය හැක්කේ එවැනි සංවාදයක් මගිනි. එසේ නැතහොත් ඊට අදාළ යම් කුමන්ත්‍රණයක් තිබේ නම් එය

පරාජය කළ හැක්කේ ද ඒ මගිනි. ඒ අනුව පළමුව එම සංවාදය තුළ ඉහත සඳහන් කළ වැරදි විග්‍රහයන් නිවැරදි කිරීම මූලික කොන්දේසියක් බවට පත්වේ. එනම් අර්බුදයේ ගැඹුර පිළිබඳ අවබෝධය ඉතා වැදගත් වේ. නිදහසින් පසුව කුමන බාධක හමුවේ වුවද ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා පැවති රජයන් විසින් ක්‍රියාමාර්ග තෝරනු ලැබූ බව රහසක් නොවේ. එහිදී එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩු කෘෂිකාර්මික නිෂ්පාදන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා ප්‍රමුඛතාව දෙනු ලැබුවේය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ වාමාංශික ප්‍රවණතාවක් සහිත ආණ්ඩු විසින් ජනසතු කිරීමේ ක්‍රියාවලිය මගින් රාජ්‍ය මැදිහත්වීම පුළුල් කරනු ලැබූ අතර දේශීය කර්මාන්ත සංවර්ධනය සඳහා ආනයනය අධෛර්යවත් කරමින් දේශීය නිෂ්පාදන දිරිමත් කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීන්දු ගනු ලැබීය. බ්‍රිතාන්‍ය නාවික හමුදාවට අයත්ව තිබූ උපායමාර්ග මර්මස්ථානයක් වූ ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය 1964දී පවුම් ලක්ෂ දෙකහමාරක් ගෙවා ආපසු පවරා ගැනීම තුළින් එම ප්‍රතිපත්තියේ ගැඹුර පිළිබිඹු වේ. කෙසේ වෙතත් 1977දී ආර්ථිකය තුළ සිදු කරනු ලැබූ බරපතළ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ මගින් එතෙක් නාමික වශයෙන් හෝ පැවති ජාතික ආර්ථික මොඩලය නව ලිබරල්වාදී කොල්ලකාරී මොඩලයක් බවට පරිවර්තනය කෙරිණි. ඒ අනුව නිදහසින් පසුව පැමිණි ගමන තුළ සියලු වැරදි සිදුවූ බවට පැතිලි මතවාදයක් ගොඩනැගීම වරදක් බව පැහැදිලි වේ.

එම නව මොඩලය තුළ ලෝක බැංකුව සහ මූල්‍ය අරමුදල මගින් ලබාදුන් ණය සහ උපදෙස් අනුව විදේශ ණය ගැනීම් වර්ධනය වූ අතර රුපියලේ අගය පහළ වැටුණි. උදාහරණයක් ලෙස 1977දී රුපියල් 8.60ක් වූ ඩොලරයට 2001වන විට රුපියල් 96ක් ගෙවීමට සිදුවිය. එය රුපියලේ අගය 1000%කින් අවප්‍රමාණය කිරීමකි. ඒ තුළ බටහිර කාර්මික රටවල් විසින් අප වැනි රටවලින් මිලදී ගන්නා අමුද්‍රව්‍ය සඳහා ගෙවන මිල බෙහෙවින් අඩු වූ අතර ඔවුන්ගේ ලාභය වර්ධනය විය. ඒ තුළ අප වැනි රටවලට පෙර ලබාගත් ඩොලර් ප්‍රමාණය ලබා ගැනීම සඳහා වැඩි වශයෙන් අමුද්‍රව්‍ය අපනයන කිරීමට සිදු විය. නමුත් අපනයනකරුවන්ට කෙටිකාලීනව තම නිෂ්පාදනවලට රුපියල්වලින් ලැබෙන මුදල් වැඩිවීම තුළ එම තත්ත්වය සාධාරණීකරණය කෙරිණි. ඊට අමතරව 1977දී ඩොලර් මිලියන 750ක් වූ විදේශ ණය ප්‍රමාණය 1995 වන විට ඩොලර් මිලියන 10,000ට ආසන්න විය. එම ආර්ථික මොඩලය තුළ අද වන විට ශ්‍රී ලංකාවේ වෙළෙඳ හිඟය දළ වශයෙන් ඩොලර් මිලියන 5,000ක් පමණ වේ. නමුත් 1977 වන විට ඊට පෙර අනුගමනය කළ දේශීය නිෂ්පාදන පද්ධතිය ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්ති නිසා ප්‍රථම වරට ශ්‍රී ලංකාවේ වෙළඳ අතිරික්තයක් ලැබීම විශේෂ තත්ත්වයකි. වෙළඳ හිඟය සහ ඒ මගින් ඇති වන ගෙවුම් ශේෂ හිඟය ඇති වන්නේ වෙළඳාම මුල්කරගත් සහ විදේශ ණය මත සිදු කරන නාගරික ඉදිකිරීම් මගින් පවත්වාගෙන යනු ලබන ඊනියා ආර්ථික වර්ධන වේගය හඹායන මොඩලයේ අනිවාර්ය ප්‍රතිඵලයක් ලෙස බව දැන් ඔප්පු වී ඇත. ජාවාරම්කාර ආනයනකරුවන්ගේ ආධිපත්‍යයට නතුවී ඇති එම මොඩලය තුළ බරපතළ බදු වංචා සිදු වන අතර ජාවාරම්කරුවන්ට නීත්‍යානුකූලව ද බදු සහන ලබා දේ. ඒ මගින් එක් පැත්තකින් රාජ්‍ය ආදායම අඩු වන අතර අනෙක් පැත්තෙන් ආනයන දිරිමත් වීම නිසා දේශීය නිෂ්පාදන පද්ධතිය කඩාවැටීමට ලක් වේ.

ඒ අනුව එම පරාධීන මොඩලය තුළ ආර්ථිකයේ පදනම හෙවත් නිෂ්පාදන පද්ධතිය ශක්තිමත් නොවන බැවින් ඒ මත ඉදිකරනු ලබන උස් බිත්ති කඩාවැටීමට ලක් වේ. කොවිඩ් සුළඟට පවා එම සිහින මන්දිර කඩාවැටෙන ආකාරය අප විසින් දැන් අත්විඳිනු ලැබේ. ඒ නිසා එම පරාධීන සහ දුර්වල සිහින මොඩලය වෙනුවට දේශීය නිෂ්පාදන පද්ධතිය ආරක්ෂා කෙරෙන සහ ශක්තිමත් කෙරෙන එමෙන්ම බහුතරයක් ජනතාවට ආර්ථික ඉඩප්‍රස්ථා නිර්මාණය කෙරෙන ආර්ථික මොඩලයක් අවශ්‍ය බව පිළිගැනීම මූලික පූර්ව කොන්දේසියකි. ඒ තුළ දීර්ඝකාලීනව ඊට අදාළ උපායමාර්ගික තීන්දු තීරණ පිළිබඳව මහජනයා දැනුවත් කළ යුතු වේ. එනම්, එමගින් ගොවියාට සාධාරණ මිලක් සහ යහපත් ජීවන තත්ත්වයක් මෙන්ම, දේශීය කර්මාන්තකරුවාට වෙළෙඳපොළ පුළුල් කෙරෙන ආකාරය රටට පැහැදිලි කළ යුතුය. එසේම ඒ තුළ ආනයන අධෛර්යවත් කරමින් දේශීය නිෂ්පාදන පද්ධතිය ශක්තිමත් කෙරෙන ආකාරය සහ ආනයන විකල්ප නිෂ්පාදන දිරි ගගන්වන ආකාරය පැහැදිලි විය යුතුය. කෙටිකාලීනව විදේශ විනිමය අර්බුදයට මුහුණදීම සඳහා වන යෝජනාවලට වලංගුභාවය හිමි වන්නේ දීර්ඝකාලීනව අභියෝගය ජයගත හැකි  මහා පින්තූරය තුළය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ණය ගැනීම හරහා දීර්ඝකාලීනව ඇති වන අර්බුදය පිළිබඳ සංවාදය මූලික පූර්ව කොන්දේසියකි. එනම් රුපියල අවප්‍රමාණය කිරීමේ ප්‍රතිඵල, රාජ්‍ය ආයතන පුද්ගලීකරණය කිරීමේ සහ වසා දැමීමේ ප්‍රතිඵල, මිල පාලනය ඉවත් කිරීමේ ප්‍රතිඵල, නිදහස් වෙළඳාම නමින් ආනයන දිරිමත් කිරීම මගින් දේශීය නිෂ්පාදන පද්ධතිය බිඳවැට්ටවීමේ ප්‍රතිඵල හා මහජන සේවා සඳහා ලබාදෙන සහනාධාර කපා හැරීම ආදී වශයෙන් මූල්‍ය අරමුදලේ කොන්දේසි මගින් ඇතිවිය හැකි තත්වය පිළිබඳ සංවාදය ඉතා වැදගත් වේ.  එය දීර්ඝකාලීන විසඳුම් සඳහා අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියකි. කෙටිකාලීන විසඳුම් පිළිබඳව සාකච්ඡා කළ යුත්තේ ඊට යටත්වය.

ඒ අනුව විදේශ සංචිත වර්ධනය කිරීම සඳහා වන කෙටිකාලීන විසඳුම් සය වැදෑරුම් යෝජනාවක් ලෙස ඉදිරිපත් කළ හැක. පළමුවැන්න විදේශ රැකියා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වර්ධනය කිරීම සඳහා දිරිගැන්වීම් ලබාදීමය. ඒ සඳහා වන පළමු අතුරු ක්‍රියාමාර්ගය ඩොලරයක් සඳහා වාණිජ බැංකු මගින් අමතරව රුපියල් 30ක් ගෙවා එම පිරිවැය කෙටිකාලීනව මහ බැංකුව විසින් දැරීමය. එය කෙටිකාලීනව රුපියලේ අගය පාවීමට ඉඩ හැරීම හෝ රුපියල අවප්‍රමාණය කිරීම තරම් භයානක නැත. ආණ්ඩුව 2020 මාර්තු සිට මේ වන විට රුපියල් බිලියන 1400කට ආසන්න ප්‍රමාණයක් මුදල් අච්චු ගසා ඇති බවට දත්ත ඉදිරිපත් වේ. ඒ අනුව කෙටිකාලීනව එම තීන්දුව ගැනීම මගින් නව අර්බුදයක් නිර්මාණය වන්නේ නැත. දෙවැන්න විදේශ විනිමය පනත නැවත සංශෝධනය කර කළු වෙළඳපොළ සහ විනිමය ජාවාරම් පාලනය කිරීමය. තුන්වන අතුරු යෝජනාව විදේශීය ප්‍රේෂණ දිරිගැන්වීම සඳහා ගිණුමේ ඉතිරියට අනුව ප්‍රමාණාත්මකව සීමාවක් පනවා විදේශ අරමුදල්වලින් ගෙවීම යන කොන්දේසිය යටතේ වාහන ආනයනය සඳහා බදු

සහන සහිත ආනයන බලපත්‍ර ලබා දීමය. ඊට සමගාමීව ණයවර ලිපි මගින් වාහන ආනයනය ඉදිරි වසර දෙක සඳහා අත්හිටුවීම ද වැදගත් වේ. ඒ මගින් මාසිකව ඩොලර් මිලියන 850 - 900ක් දක්වා ප්‍රේෂණ වර්ධන කර ගැනීමේ හැකියාව ඇත.

දෙවන මූලික යෝජනාව, ප්‍රායෝගික වෘත්තීය පුහුණුව සහිත එහෙත් සහතික නොමැති පිරිස් සහ හමුදා සෙබළුන්ට කඩිනම් වෘත්තීය පුහුණුව ලබාදීම හරහා ඉලක්ක සහගත ලෙස විදේශ රැකියා වෙළෙඳපොළ පුහුණු ශ්‍රමිකයින් මගින් ආක්‍රමණය කිරීම ය. ඒ සඳහා හමුදා නිලධාරීන්ට වසර 2ක වැටුප් රහිත නිවාඩු ලබා දීම මගින් වැටුප් පිරිවැය ද අඩුකරගත හැක. තුන්වන මූලික යෝජනාව වන්නේ ආනයනය සඳහා විදේශ මුදල් අනුමත කිරීමේදී විනිවිදභාවය පවත්වාගෙන යෑම සහ මහජන සංවාදයක් සහිතව අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීමය. ආනයන සීමා කිරීමක් සිදු නොකර, ඩොලර් නිදහස් නොකර සිටීම මගින් කළු වෙළෙඳපළ තුළ ඉල්ලුම වැඩි වන අතර ඩොලරයේ අගය ඉහළ යාමට හේතු වේ. ඊට අමතරව අපනයන ආදායම් රට තුළට කඩිනමින් ගෙන්වීම සඳහා දිරිගැන්වීම් ලබා දීම ද වැදගත්ය. නිමි නිෂ්පාදන වෙනුවට අමුද්‍රව්‍ය ආනයනය කිරීම සහ ඒ මගින් දේශීයව වටිනාකම් එකතු කිරීම දිරිගැන්වීම සඳහා බදු ප්‍රතිපත්තියක් හඳුන්වා දීම දෙවන අතුරු යෝජනාව ලෙස සැලකිය හැක. ඊට අදාළ තුන්වන අතුරු යෝජනාව වන්නේ දේශීය කර්මාන්ත සඳහා, විශේෂයෙන්ම අපනයන කර්මාන්තවල අමුද්‍රව්‍ය ආනයනය සඳහා ප්‍රමුඛතාවයෙන් යුතුව ඩොලර් නිදහස් කිරීමය. ඒ මගින් ද කළු වෙළඳපොළ තුළ ඩොලර් ඉල්ලුම අඩු වේ.

හතරවන යෝජනාව රාජ්‍ය බැංකු මගින් කොටස් මිලදී ගැනීම හරහා විදේශ විනිමය මහා පරිමාණයෙන් ඉපයීමට හැකි කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දීමය. මිනිරන්වලින් ග්‍රැෆීන් හෙවත් කළු රත්තරන් නිපදවීම සහ ඛනිජ වැලිවලින් ටයිටේනියම් ලෝහය නිස්සාරණය කිරීම ඊට උදාහරණ ලෙස සැලකිය හැක. එමගින් වසර 2කදී වාර්ෂිකව ඩොලර් මිලියන 5000 සිට 8000 දක්වා විදේශ විනිමය ආදායම් වර්ධනය කර ගැනීමේ හැකියාව ඇති බව ඊට අදාළ ශක්‍යතා වාර්තාවලන් පැහැදිලි වේ. පස්වැන්න සංචාරක කර්මාන්තය, දේශීය වෛද්‍ය සේවා මත පදනම්ව නැවත ස්ථානගත කිරීමය. ඒ මගින් විශේෂයෙන්ම දීර්ඝකාලීනව නතර වන සංචරකයින් දිරිගැන්වීම හරහා සංචාරක ක්ෂේත්‍රයේ ආදායම් 50%කින් වැඩි කළ හැකි බව ක්ෂේත්‍රයේ ප්‍රවීණයෝ පවසති. සයවැනි යෝජනාව වන්නේ සියලුම ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අදාළ ආයතන සමඟ සාකච්ඡා කිරීම සහ පළමු වටයේදී පොලිය පමණක් ගෙවා ණය වාරික අත්හිටුවීම සඳහා තීරණයක් ගැනීමය. චීනය සහ ගෝලීය බහුපාර්ශ්වීය ආයතනවලින් ලබාගත් ණය සඳහා එම සාකච්ඡා ක්‍රියාවලිය කඩිනමින් ආරම්භ කිරීමේ හැකියාව ඇත. වාණිජ ණය සහ බැඳුම්කර පිළිබඳව ඒ සඳහා පහසුකම් සලසන ජාත්‍යන්තර උපදේශන ආයතන සමඟ සාකච්ඡා කළ හැක. ඒ මගින් මූල්‍ය අරමුදලේ බලපෑම මත රුපියල පා කිරීම හෝ බංකොලොත්භාවය ප්‍රකාශ කිරීම මගින් අර්බුදය තවදුරටත් උත්සන්න වීම වළක්වාගත හැක. මෙම විකල්ප යෝජනා ඉහළට එසවීම වැදගත් වන්නේ ඉහත සඳහන් කළ ආපදා අධිරාජ්‍යවාදී මෙහෙයුම පරාජය කිරීම සඳහා මෙන්ම ශ්‍රී ලාංකීය ජාතියට වර්තමාන අර්බුදයට මුහුණදිය හැකි බවට මහජනයා තුළ විශ්වාසය තහවුරු කිරීම සඳහාය.

# ජාතික සංවිධාන එකමුතුව

2023-11-20

**සටහන:-**

මෙම ලිපිය පළකරනු ලැබුවේ අර්බුදය උත්සන්න වීම ආරම්භ වූ කාලය වන 2022 පෙබරවාරි 11 වන දිනය. ඊට පෙර ජාතික සංවිධාන නියෝජිතයින් පිරිසක් ආරක්ෂක ලේකම්වරයාගේ අවසරය මත 2022 ජනවාරි 11 වන දින ආරක්ෂක මණ්ඩලය හමුවට ගොස් රටේ ආරක්ෂක හමුදා බිය වැද්දවීමේ ක්‍රියාන්විතයක් දියත් වන බවට කරුණු සහිතව ඔප්පු කළ අතර වහාම එම තත්වය වෙනස් කිරීමට පියවර ගන්නා ලෙස ද ඉල්ලා සිටින ලදී. එහිදී විවිධ ජාත්‍යන්තර සංවිධාන විසින් ජාත්‍යන්තර මානව හිමිකම් සමුළුවට සහ ඇමෙරිකාවේ කොංග්‍රස් මණ්ඩලයේ මානව හිමිකම් කමිටුවට ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවල උසස් නිලධාරීන් 48 දෙනෙකුට එරෙහිව යුද අපරාධ චෝදනා එල්ල කරන තත්වයක් තුළ එවකට යුද හමුදාපති සහ ආරක්ෂක ලේකම්වරයාට එරෙහිව පමණක් චෝදනා පත්‍ර සකස් කර ඉදිරිපත් කරන්නේ කුමක් නිසාදැයි තේරුම් ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී. එහෙත් එම කරුණු වටහාගත් බවක් නොපෙනුනු බැවින් පිටු 137ක් වූ හමුදාපතිවරයාට එරෙහිව සකස් කළ චෝදනා පත්‍රය සහ පිටු 100ක් වූ ආරක්ෂක ලේකම්වරයාට එරෙහිව සකස් කළ චෝදනා පත්‍රය ඉදිරිපත් කරන ලදී. මෙම ජාත්‍යන්තර මෙහෙයුමේ යටි අරමුණු තේරුම් නොගැනීමේ ප්‍රතිඵල 2022 මාර්තු 31 වනදා සිදුවීම්වලට පසුව මහජනයාට නම් තේරුම් ගැනීමට හැකිවිය. එම ක්‍රියාවලියේම දිගුවක් ලෙස ඉන්දියාවේ බලපෑම මත මිලින්ද මොරගොඩ මහතාගේ මැදිහත්වීම තුළ සහ ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතාගේ උපදෙස් පරිදි 2022 මාර්තු 07 වන දින ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය නිදහසේ පා කිරීමට ගනු ලැබූ වැරදි තීන්දුවේ ප්‍රතිඵල මේ වන විට මහජනයා අත්විඳිමින් ඇත. ඉන් පසුව වත්මන් මහබැංකු අධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවේ හෝ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව අපදා අධිරාජ්‍යවාදී මෙහෙයුමට අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියක් වූ බංකොලොත්භාවය 2022 අප්‍රේල් 12 වන දින ප්‍රකාශයට පත් කරනු ලැබීය. ඒ මගින් ඉන්දියාවට ශ්‍රී ලංකාවේ එකම ගැලවුම්කාරයා ලෙස පෙනී සිටීමට හැකිවීම මගින් ඉහත සඳහන් කළ පරිදි සර්දාර් පනික්කාර් න්‍යාය පත්‍රය ඉදිරියට ගෙනයෑමට ඉතා වාසිදායක තත්වයක් නිර්මාණය වූ බව ද දැන් ඉතා පැහැදිලිය.